## 2.4 සම්භාවිතා ඉගෙනුම් කට්ටලය



හැඳින්වීම:- නියැදි අවකාශයට අදාළ එක් එක් ප්‍රතිඵලය සිදුවීමේ සාර්ථක භාගය ගණනය කිරීම සඳහා යොදාගත හැකි උපකරණයකි. දිග 37.5cm හා පළල 30cm ලෑලි පුවරුවක් මත සවිකරන ලද ඇණයක් වටා කැර කැවිය හැකි වර්ණ / සංඛ්‍යා / සත්ව රූප වලින් සමන්විත තැටි ඇතුළත් වේ.

භාවිතා කළහැකි අවස්ථා :-

| පාඩම | භාවිත කළ හැකි අවස්ථා | ශ්‍රේණිය | පාඩම |
|---|---|---|---|
| සම්භාවිතාව | 1. අහඹු පරීක්ෂණයක නියදි අවකාශ ලිවිම. | 9 | සම්භාවිතාව |

ගුරු උපදෙස් :-

1. අදාළ ක්‍රියාවලියක අඩංගු ප්‍රතිඵල කුලකය (නියැදි අවකාශය)
2. අපේක්ෂිත සිද්ධිය පිළිබඳව දැනුම
3. සාර්ථක භාගය / පරීක්ෂණාත්මක සම්භාවිතාව
4. ප්‍රගණන වගු හා ප්‍රගණන ලකුණු

පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම

සිසු උපදෙස් :-

කාර්ය පත්‍රිකාව

1. උපකරණයෙහි M වටා එහි රැඳ වූ තැටිය ක්ෂණික භ්‍රමණයකට ලක්කර නිදහසේ නිශ්චලවීමට ඉඩ දෙන්න.
2. පහත දැක්නෙ ආකාරයේ අදාළ නියැදි අවකාශයට වගුවක් සූදානම් කර ගන්න.

| අපේක්ෂිත ප්‍රතිඵලය | ප්‍රගණනය | සංඛ්‍යාතය (වාර ගණන) |
|---|---|---|
| 01. ලැබීම | | |
| 02. ලැබීම | | |
| 03. ලැබීම | | |
| 04. ලැබීම | | |
| 05. ලැබීම | | |
| 06. ලැබීම | | |
| | එකතුව | |

3. දර්ශකය ඉදිරියේ රඳුනු ප්‍රතිඵලයට ඉදිරියෙන් වගුවෙහි ප්‍රගණන ලකුණක් යොදන්න.
4. තීරණය කර ගත් නිශ්චිත වාර ගණනක් සඳහා ඉහත පියවර ක්‍රියාත්මක කරමින් වගුව සම්පූර්ණ කරන්න.
5. නියැදි අවකාශයට අදාළ එක් එක් ප්‍රතිඵලය සිදුවීමේ සාර්ථක භාගය ගණනය කරන්න.
6. වෙනත් නිශ්චිත වාර ගණනක් සඳහා ද ඉහත පියවර පහ යළි යලිත් කරමින් සකසා සාර්ථක භාගය සොයන්න.
7. එක් එක් ප්‍රතිඵලයට අදාළ සාර්ථක භාග ඇසුරින් සම්භාවිතාව සඳහා සුදුසු අගය යෝජනා කිරීමට යොමු කරන්න.

(ඊ). අමතර

I. ඉහත උපකරණ දෙකක් එකම සේ වූ තනි උපකරණ නිමවා සංයුක්ත සිද්ධි සඳහා යොදා ගන්න.

